# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1646/16 - 2010 මාර්තු 23 වැනි අඟහරුවාදා - 2010.03.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**බස්නාහිර පළාතේ පළාත් සභාව**

බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2010 අංක 01 දරන බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතන පාලන අධිකාරී ප්‍රඥප්තිය

බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් 2010 පෙබරවාරි මස 09 වැනි දින අනුමත කරන ලදුව බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමන් විසින් 2010 මාර්තු මස 08 වැනි දින අත්සන් තබන ලද බස්නාහිර පළාතේ 2010 අංක 01 දරන බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතන පාලන අධිකාරී ප්‍රඥප්තිය 2010 මාර්තු මස 08 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු බවට බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමුපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් සහ ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍ය උපාලි කොඩිකාර වන මම මෙයින් නියම කරමි.

උපාලි කොඩිකාර,
බස්නාහිර පළාත් සභාවේ ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු,
සංස්කෘතික හා කලා කටයුතු, සමුපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා
බෙදා හැරීම් සහ ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍ය.

2010 මාර්තු මස 18 වැනි දින,
බත්තරමුල්ල,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ,
අංක 204 දරන ස්ථානයේ පිහිටි,
බස්නාහිර පළාත් ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු,
සංස්කෘතික හා කලා කටයුතු, සමුපකාර සංවර්ධන,
ආහාර සැපයීම් හා බෙදා හැරීම් සහ ග්‍රාම සංවර්ධන කටයුතු අමාත්‍යාංශයේ දී ය.

**2010 අංක 01 දරන බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතන පාලන අධිකාරී ප්‍රඥප්තිය**

බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනය කළමනාකරණය කිරීම සහ නඩත්තු කිරීම සඳහා ද ; රඟ දැක්වීම, සංගීතය, ප්‍රසංග හා විනෝද කටයුතු දිරි ගැන්වීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික සියලු කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද; බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතන පාලන අධිකාරියක් පිහිටුවීම පිණිස වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ :–

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.

01. මෙම ප්‍රඥප්තිය 2010 අංක 01 දරන බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතන පාලන අධිකාරී ප්‍රඥප්තිය වශයෙන් හඳුන්වනු ලබන අතර, බස්නාහිර පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමතය ලැබූ දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

## *I* වන කොටස

*පළාත් සෞන්දර්ය නිකේතන පාලන අධිකාරිය පිහිටුවීම සහ එහි සංයුතිය*

බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතන පාලන අධිකාරිය පිහිටුවීම.

02. (1) (මෙහි මින් මතු 'පාලන අධිකාරිය' යනුවෙන් හඳුන්වනු ලබන) බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතන පාලන අධිකාරිය මෙයින් පිහිටුවනු ලැබේ.

(2) පාලන අධිකාරිය (1) වැනි උපවගන්තියෙන් එයට වෙන්කර දී ඇති නාමයෙන් නෛතික පුද්ගලයන් විය යුතු අතර ඊට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතුය. පාලන අධිකාරියට, ඉහත (2) (1) උපවගන්තියේ සඳහන් නමින් එකී පාලන අධිකාරිය වෙනුවෙන් සහ ඊට විරුද්ධව ද නඩු පැවරිය හැකිය.

පාලන අධිකාරියේ සාමාජිකයින්

03. (1) පාලන අධිකාරිය පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතුය :

*(අ)* නිල බලයෙන් පත් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙකුගෙන්, එනම් ;

(i) බස්නාහිර පළාත් සභාවේ සංස්කෘතික විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහු විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් ;

*(ආ)* බස්නාහිර පළාත් සංස්කෘතික විෂයය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන (මෙහි මින්මතු 'පත්කළ සාමාජික' යනුවෙන් හඳුන්වනු ලබන) –

(i) මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව පත් කරනු ලබන පළාත් භාණ්ඩාගාරයේ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියෙකු ;

(ii) නාට්‍යය, සංගීතය, නර්තනය හෝ සිනමා යන ක්ෂේත්‍රයක හෝ ක්ෂේත්‍රවල පෘථුල පළපුරුද්දක් සහ නිපුණත්වයක් ලබා ඇත්තාවූ තැනැත්තන් අතරින් පත් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙකු.

(2) යම් තැනැත්තෙකු පාර්ලිමේන්තුවෙහි, යම් පළාත් සභාවක හෝ යම් පළාත් පාලන ආයතනයක සාමාජිකයෙකු වේ නම් හෝ එවැන්නෙකු ලෙස පත් කරනු ලැබුවේ නම් හෝ එවැනි අයෙකු පාලන අධිකාරියේ සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීමට නුසුදුස්සෙක් වන්නේය.

(3) බස්නාහිර පළාත් සභාවේ සංස්කෘතික විෂයය භාර අමාත්‍යතුමා විසින් නම් කරනු ලබන සාමාජිකයන් අතරින් එක් අයෙකු එකී පාලන අධිකාරියේ සභාපතිවරයා වන්නේය.

සාමාජිකයන්ගේ ධුර කාලය.

04. (1) *(අ)* යම් සාමාජිකයෙකුගේ මරණය, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම හේතුවෙන් ධුරය අවසන් වුවහොත් මිස, අමාත්‍යවරයා විසින් පත්කළ සාමාජිකයෙකුට වසර තුනක කාලයක් ධුරය දැරිය හැක. තව ද ඔහු ඉවත් කරනු ලැබුවහොත් මිස නැත්නම් නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු වන්නේය.

*(ආ)* අමාත්‍යවරයා විසින් පත් කළ සාමාජිකයෙකුව අමාත්‍යවරයාට එකී ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි අතර, එකී සාමාජිකයාගේ ඉතිරි වී ඇති ධුර කාලය සඳහා අමාත්‍යවරයා විසින් නව සාමාජිකයෙකු පත් කළ හැකිය.

*(ඇ)* පාලන අධිකාරියේ කවර හෝ සාමාජිකයෙකු රෝගාතුර වීම නිසා හෝ වෙනත් යම් අබලතාවයක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ මාස තුනකට නොඅඩු කාලයක් සාමාජිකයෙකුගේ ධුරයේ කාර්යයන් ඉටු කිරීමට අපොහොසත් වන අවස්ථාවක,

(i) සාමාජිකයා පත්කළ සාමාජිකයෙකු නම් ඒ වෙනුවට කටයුතු කිරීම සඳහා 3(1)(ආ) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් වෙනත් තැනැත්තෙකු බස්නාහිර පළාත් සභාවේ සංස්කෘතික විෂයය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකිය.

(ii) සාමාජිකයා 3(1)(අ) (i) සහ (ii) අනුඡේදයන් යටතේ දක්වා ඇති නිලධාරියෙකු නම්, එම නිලධාරියාගේ තනතුරේ වැඩ බැලීමට පත්කර ඇති තැනැත්තෙකු එම නිලධාරියා වෙනුවට වැඩ බැලීමට පත් කරනු ලැබිය යුතුය.

(2) *(අ)* පාලන අධිකාරිය රැස්වන සෑම දිනයක් සඳහාම එසේ රැස්වන දිනට අදාළව සෑම සාමාජිකයෙකුටම අමාත්‍යවරයා නියම කරනු ලබන පාරිශ්‍රමිකයක් ගෙවිය යුතුය ; පාලන අධිකාරියේ රැස්වීම්.

*(ආ)* පාලන අධිකාරිය විසින් තීරණය කළ යුතු යැයි මෙම ප්‍රඥප්තිය මගින් බලය දී ඇති සියලු කාරණා මෙම ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූලව පවත්වනු ලබන පාලන අධිකාරියේ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කළ යුතුය ;

*(ඇ)* පාලන අධිකාරියේ සභාපතිවරයා පැමිණ සිටින්නේ නම් පාලන අධිකාරියේ සෑම රැස්වීමකම මූලාසනය දැරිය යුතුය. එවැනි යම් රැස්වීමක සභාපතිවරයා පැමිණ නොසිටින අවස්ථාවක පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතුරින් එක් අයෙකු මූලාසනය දැරීම පිණිස තෝරා පත්කර ගත යුතුය ;

*(ඈ)* පාලන අධිකාරියේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් තුන් දෙනෙකු විය යුතුය ;

*(ඉ)* පාලන අධිකාරියේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබිය දී වුවද පාලන අධිකාරියට ක්‍රියා කළ හැකිය ;

*(ඊ)* පාලන අධිකාරියේ ක්‍රියාවක්, තීරණයක් හෝ කටයුත්තක් අධිකාරියේ සාමාජිකයින්ගේ යම් පුරප්පාඩුවක් පැවතීමේ හේතුවෙන් හෝ එහි යම් සාමාජිකයෙකුගේ පත්වීමේ ඇති යම් දෝෂයක් හේතුවෙන් පමණක් අවලංගු ලෙස නොසැලකිය යුතුය ;

*(එ)* පාලන අධිකාරියේ පත් කළ සාමාජිකයෙකු වාර තුනක් නොදන්වා රැස්වීමට නොපැමිණියහොත් ධුරය අහෝසි වූවා සේ සැලකේ ;

*(ඒ)* පාලන අධිකාරිය යටත් පිරිසෙයින් මාසයකට එක් වරක්වත් රැස්විය යුතුය.

05. *(අ)* පාලන අධිකාරියේ මුද්‍රාව සභාපතිවරයා භාරයේ තිබිය යුතුය ; පාලන අධිකාරියේ මුද්‍රාව.

*(ආ)* පාලන අධිකාරියේ මුද්‍රාව පාලන අධිකාරිය තීරණය කරනු ලබන ආකාරය අනුව සකස් කරනු ලැබිය හැකිය ;

*(ඇ)* පාලන අධිකාරියේ මුද්‍රාව, පාලන අධිකාරියේ සාමාජිකයන් දෙදෙනෙකු ඉදිරිපිට හැර කිසිම සාධන පත්‍රයකට, ලේඛනයකට හෝ ගිවිස්නාවකට හෝ නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටින බවට සාක්ෂි වශයෙන් එම සාමාජිකයන් දෙදෙනාම ඒ සාධන පත්‍රයට හෝ ලේඛනයට හෝ ගිවිස්නාවට හෝ අත්සන් තැබිය යුතුය. සාමාජිකයන් දෙදෙනාගෙන් එක් අයෙකු පාලන අධිකාරියේ සභාපති විය යුතුය ;

## *II වන කොටස*

### *පාලන අධිකාරියේ අරමුණු, බලතල, කාර්යයන් හා කර්තව්‍යයන්*

06. (1) පාලන අධිකාරියේ අරමුණු පහත සඳහන් පරිදි විය යුතුය ; අරමුණු .

*(අ)* පළාත් සෞන්දර්ය නිකේතනය කළමනාකරණය කිරීම හා නඩත්තු කිරීම ;

*(ආ)* පළාත තුළ රඟ දැක්වීම, සංගීතය, ප්‍රසංග හා විනෝද කටයුතු දිරි ගැන්වීම හා ප්‍රවර්ධනය කිරීම ;

*(ඇ)* සංස්කෘතික හා කලා කටයුතු පිළිබඳ දැනුම, අවබෝධය හා එහි භාවිතය වර්ධනය කිරීම හා වැඩි දියුණු කිරීම ;

*(ඈ)* බස්නාහිර පළාත තුළ සහ අනෙකුත් පළාත් සමග සංස්කෘතික වටිනාකමක් ඇති වැඩසටහන් සැලසුම් කිරීම, දැනුම හුවමාරු කර ගැනීම සහ ඒකාබද්ධ වැඩ සටහන් සැලසුම් කිරීම.

පාලන අධිකාරියේ බලතල, කාර්යයන් හා කර්තව්‍යයන්.

07. පාලන අධිකාරියේ බලතල, කාර්යය හා කර්තව්‍යයන් පහත දැක්වෙන පරිදි විය යුතුය :

(අ) මෙම ප්‍රඥප්තියේ අරමුණුවලට අනුකූල වන මුදලින් හෝ ද්‍රව්‍යවලින් ලැබෙන ප්‍රදාන, තෑගි හෝ පරිත්‍යාග බාර ගැනීම හා පරිහරණය කිරීම ;

(ආ) මෙම ප්‍රඥප්තිය යටතේ සාදන ලද රීතිවලට යටත්ව පාලන අධිකාරියේ අරමුණු ඉටු කර ගැනීම පිණිස ආධාර මුදල්, පරිත්‍යාග හෝ ශිෂ්‍යත්ව ලබාදීම ;

(ඇ) මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට යටත්ව නිලධරයන් හා සේවකයන් පත් කිරීම, උසස් කිරීම, සේවයෙන් පහ කිරීම, විනය පාලනය හා වෙනත් ප්‍රතිලාභ ලබාදීමට කටයුතු කිරීම ;

(ඈ) පළාත් සෞන්දර්ය නිකේතනය නඩත්තු කිරීම සම්බන්ධ ගාස්තු නියම කිරීම ;

(ඉ) මුදල් ආයෝජනය, මුදල් පරිහරණය හා බැංකු කටයුතු ආදී මූල්‍ය කටයුතු සඳහා පාලන අධිකාරියේ ක්‍රියාකාරිත්වය සම්බන්ධ සියලු කාරණාවලට මැදිහත්වීම, නිලධාරින්ට පැවරීම සහ සොයා බැලීම ;

(ඊ) නිලධරයන්ගේ හා සේවකයන්ගේ පාරිශ්‍රමික, සේවා කොන්දේසි සහ පළාත් රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ පටිපාටි බස්නාහිර පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ඇතිව ඉටු කිරීම ;

(උ) බස්නාහිර පළාත් සභාවේ යම් නිලධරයෙකු, අදාළ නිලධාරියාගේ කැමැත්ත ඇතිව හා පත්වීම් බලධාරියාගේ එකඟත්වය මත පාලන අධිකාරියට අනුයුක්ත කිරීම ;

(ඌ) ස්වකීය අරමුණු නිසි අයුරින් ක්‍රියාවේ යෙදවීම පහසු කිරීම පිණිස පාලන අධිකාරියේ තීරණය පරිදි පරිපාලනය හා මුල්‍යමය කටයුතු ඇතුළු වෙනත් එවැනි සියලු දේ කිරීම සඳහා පාලන අධිකාරියට බලය තිබිය යුතුය ;

(එ) ඉහත වගන්තිවල සඳහන් කරුණු ඉටු කර ගැනීම පිණිස ගන්නා වූ කවර හෝ ක්‍රියාමාර්ගයක් සඳහා පාලන අධිකාරියට බලය තිබිය යුතුය.

## ***III*** *වන කොටස*

*පාලන අධිකාරියේ කාර්ය මණ්ඩලය*

අධ්‍යක්ෂවරයා පත් කිරීම.

08. (1) පාලන අධිකාරිය විසින් පත් කරනු ලබන අධ්‍යක්ෂවරයෙකු පූර්ණකාලීනව සිටිය යුතු අතර, ඔහු අධිකාරියෙහි මග පෙන්වීම යටතේ සෑම විටම ක්‍රියා කළ යුතුය.

(2) මෙම ප්‍රඥප්තිය යටතේ පත් කරනු ලබන අධ්‍යක්ෂවරයා පාලන අධිකාරියේ ලේකම් වශයෙන් කටයුතු කළ යුතු වන අතර, ඔහුට පාලන අධිකාරිය වෙනුවෙන් ඡන්දය ප්‍රකාශ කිරීමෙහි හිමිකමක් නොමැති අතර, අදහස් ප්‍රකාශ කිරීම පමණක් කළ හැකිය.

(3) අධ්‍යක්ෂවරයාගේ පත්වීම අවසන් කිරීම අවශ්‍ය යැයි පාලන අධිකාරිය සලකන්නේ නම්, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව පාලන අධිකාරිය විසින් ඕනෑම අවස්ථාවක එසේ කළ හැකිය.

අධ්‍යක්ෂවරයා සතු බලතල හා කාර්යයන්.

09. අධ්‍යක්ෂවරයාට පහත සඳහන් බලතල හිමිවේ :

(අ) පාලන අධිකාරිය විසින් අනුමත කරන ලද සියළු ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග ක්‍රියාවේ යෙදවීම ;

(ආ) පාලන අධිකාරියේ පොදු විධානයට යටත්ව කටයුතු පරිපාලනය කිරීම සහ කාර්ය මණ්ඩලය පාලනය කිරීම ;

(ඇ) පාලන අධිකාරියේ රැස්වීම් සඳහා න්‍යාය පත්‍රය සකස් කිරීම සහ ප්‍රඥප්තියේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාවේ යෙදවීම සඳහා අවශ්‍ය යැයි ඔහු විසින් සලකනු ලබන ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග පාලන අධිකාරියට ඉදිරිපත් කිරීම ;

(ඈ) පාලන අධිකාරිය විසින් ඔහු වෙත පවරනු ලබන හෝ නියම කරනු ලබන වෙනත් බලතල හෝ කාර්යයන් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම.

### *IV* වන කොටස

*මුදල්*

10. (1) පාලන අධිකාරියට පාලන අධිකාරියේ නමින් අරමුදලක් තිබිය යුතුය. පාලන අධිකාරියේ අරමුදල.

පාලන අධිකාරියේ අරමුදලට පහත සඳහන් මුදල් ගෙවනු ලැබිය යුතුය :

*(අ)* පාලන අධිකාරියේ ප්‍රයෝජනය සඳහා පළාත් සභාව විසින් කලින් කල විසර්ජනය කරනු ලබන සියළු මුදල් ;

*(ආ)* පාලන අධිකාරිය විසින් ඉටු කරන සේවා හෝ සපයනු ලබන පහසුකම් හෝ සම්බන්ධයෙන් ගාස්තු වශයෙන් හෝ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේදී හා කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීමේ දී අධිකාරියට ලැබෙන සියලු මුදල් ;

*(ඇ)* ශ්‍රී ලංකාවෙහි හෝ ඉන් පිටත හෝ කවර හෝ ප්‍රභවයන්ගෙන් ණය පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් අධිකාරියට ලැබෙන සියලු මුදල් ;

(2) ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී කටයුතු කිරීමේ දී හා කාර්යයන් ඉටු කිරීමේ දී අධිකාරිය විසින් කරනු ලබන යම් වියදමක් දැරීම සඳහා අවශ්‍ය සියලු මුදල් වියදම් ගෙවීමට අවශ්‍ය සියලු මුදල් පාලන අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය හැකිය. අරමුදලින් කළ යුතු ගෙවීම්

(3) පාලන අධිකාරියේ ආරම්භක ප්‍රාග්ධනය රුපියල් දස ලක්ෂ පහක් විය යුතුය. ආරම්භක ප්‍රාග්ධනය අමාත්‍යවරයා විමසා, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන වාරික ප්‍රමාණයකින්, පළාත් සභා අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, (1) උපවගන්තිය යටතේ පිහිටුවනු ලැබූ අරමුදලට ඒ මුදල් බැර කරනු ලැබිය යුතුය.

(4) මේ ප්‍රඥප්තිය යටතේ පාලන අධිකාරියේ වගකීම් නිරවුල් කිරීම සඳහා හෝ පාලන අධිකාරියේ කාර්යයන් ඉටු කිරීම සඳහා අධිකාරියට අවශ්‍ය වන මුදල් අයිරාවක මාර්ගයෙන් හෝ අන්‍යාකාරයකින් පාලන අධිකාරිය විසින් අමාත්‍යවරයාගේ කැමැත්ත ඇතිව හෝ ඔහු විසින් දෙන ලද යම් පොදු අනුමැතියක නියමයන්ට අනුකූලව තාවකාලිකව ණයට ගනු ලැබිය හැකිය.

එසේ වුව ද, මෙම උපවගන්තිය යටතේ පාලන අධිකාරිය විසින් ලබා ගන්නා ලද යම් තාවකාලික ණය සම්බන්ධයෙන් යම් අවස්ථාවක දී ගෙවීමට තිබෙන ණය මුදල්වල එකතුව අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා, තීරණය කරනු ලබන මුදලක් නොඉක්මවිය යුතුය.

11. (1) පාලන අධිකාරියේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතුය.

(2) පාලන අධිකාරියේ අරමුදලේ භාරය, ඒ අරමුදලට මුදල් ගෙවීම, ගිණුම් තැබීම අයවැය ඇස්තමේන්තු සකස් කිරීම සහ ඒ කාරණාවලට සම්බන්ධ හෝ අනුයාත වෙනත් සියලු කරුණු අමාත්‍යවරයා විසින් සාදනු ලබන රීති මගින් විධිමත් කරනු ලැබිය යුතුය.

12. (1) ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වැනි ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ වන්නේය. ගිණුම් විගණනය

(2) අරමුදලේ ගිණුම් හා ඒ සම්බන්ධ විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පිටපතක් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. ඔහු විසින් එය පාලන අධිකාරියේ වාර්ෂික වාර්තාව ද සමග පළාත් සභාව ඉදිරියේ තැබීමට සැලැස්විය යුතුය.

*V වන කොටස*

*පොදු විධිවිධාන*

13. (1) පාලන අධිකාරියේ සියලු නිලධරයන් හා සේවකයන් ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ සඳහන් විනය කාර්ය පටිපාටියට ඇතුළත් වන අතර, දණ්ඩ නීති සංග්‍රහයෙහි විධිවිධාන සම්බන්ධයෙන් රජයේ නිලධාරීන් සහ සේවකයන් ලෙස සැලකිය යුතුය.

(2) පාලන අධිකාරිය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර එම පනතේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතුය.

රීති සෑදීමේ බලය

14. (1) මේ ප්‍රඥප්තිය යටතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට, බලාත්මක කිරීමට හා ගාස්තු අය කිරීමට අදාළ පහත සඳහන් සියලුම කරුණු හෝ ඉන් යම් කරුණක් සම්බන්ධයෙන් මෙම ප්‍රඥප්තියෙන් පැවරෙන බලතලවලට හානියක් නොමැතිව මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම අමාත්‍යවරයා විසින් කරනු ලැබිය හැකිය ፡ -

*(අ)* පාලන අධිකාරියේ රැස්වීම් කැඳවිය යුතු ආකාරය නියම කිරීම හා රැස්වීම් පැවැත්විය යුතු ආකාරය නියම කිරීම ;

*(ආ)* පාලන අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරි වශයෙන් අධ්‍යක්ෂකගේ බලතල හා කාර්යයන් ;

*(ඇ)* පාලන අධිකාරියේ මූල්‍ය හා පරිපාලන කාර්ය පටිපාටීන් ;

*(ඈ)* පාලන අධිකාරියේ අරමුණු, බලතල, කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කරනු පිණිස හා මෙම ප්‍රඥප්තිය යටතට ගැනිය හැකි කවර හෝ කාරණා සම්බන්ධයෙන්.

(2) මේ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම රීතියක්ම *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු අතර, එසේ පලකරනු ලැබූ දින හෝ ඒ රීතියේ සඳහන් යම් පසු දිනයක හෝ සිට එය ක්‍රියාත්මක විය යුතුය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම රීතියක්ම එය *ගැසට් පත්‍රයේ* පළ කිරීමෙන් පසු මාස තුනක් ඇතුළත අනුමතය සඳහා පළාත් සභාවට ඉදිරිපත් කරනු ලැබිය යුතුය. එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක් ඒ අනනුමතයේ දින පටන් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතුය.

අර්ථ නිරූපනය.

15. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම ප්‍රඥප්තියේ ፡-

"අමාත්‍යවරයා" යන්නෙන් බස්නාහිර පළාත් සභාවේ සංස්කෘතික විෂයය භාර අමාත්‍යවරයා අදහස් වේ.

"මුදල් අමාත්‍යවරයා" යන්නෙන් බස්නාහිර පළාත් සභාවේ මුදල් විෂයය භාර අමාත්‍යවරයා අදහස් වේ.

"අමාත්‍යංශය" යන්නෙන් බස්නාහිර පළාත් සභාවේ සංස්කෘතික විෂයය භාර අමාත්‍යංශය අදහස් වේ.

"අමාත්‍යංශයේ ලේකම්" යන්නෙන් බස්නාහිර පළාත් සභාවේ සංස්කෘතික විෂයය භාර අමාත්‍යංශයේ ලේකම් අදහස් වේ.

"ආයතන සංග්‍රහය" යන්නෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද ආයතන සංග්‍රහයේ II කාණ්ඩය අදහස් වේ.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

16. මෙම ප්‍රඥප්තියේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

04-251

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.